# යෞවනයන් විෂය කොටගත් සිංහල ප්‍රබන්ධ කෘති

(විචාරාත්මක විමර්ශනයක්)

ස්වර්ණා චන්ද්‍රසේකර
බී.ඒ. (ගෞරව), එම්.ඒ., අධ්‍යාපන ඩිප්ලෝමා (සම්මාන)

95/Ph.D./52

මෙම පර්යේෂණ නිබන්ධය
කොළඹ විශ්වවිද්‍යාලයේ දර්ශන විශාරද (Ph.D.)
උපාධිය සඳහා ඉදිරිපත් කරනු ලබන්නකි.

UCLIB
522514

2003 ජුනි

University of Colombo Library Sri Lanka

# හැඳින්වීම

මෙම අධ්‍යයනය ක්‍රිස්තු වර්ෂ 1940 සිට 1994 දක්වා කාල පරිච්ඡේදය තුළ දී ශ්‍රී ලංකාවේ ලේඛනගත වී ඇති සිංහල යෞවන ප්‍රබන්ධ කෘති පිළිබඳව කරනු ලබන විමර්ශනයකි. මේ සඳහා උපයෝගී කොටගෙන ඇත්තේ වයස අවුරුදු දොළහේ සිට දහහත දක්වා වියෙහි වූ හයවැනි ශ්‍රේණියේ සිට එකොළොස්වැනි ශ්‍රේණිය දක්වා වූ යෞවනයන්ගේ කියවීම සඳහාම ඉහත දැක්වූ කාල පරිච්ඡේදය තුළ ලියැවී ප්‍රකාශයට පත් වී ඇති සිංහල යෞවන ප්‍රබන්ධ කතා සහ පොදු පාඨකයා සඳහා ලියන ලද, එහෙත් යෞවනයන් කතා නායක නායිකාවන් වූ සහ යෞවන ලෝකය වස්තු කොටගත් උක්ත කාල පරිච්ඡේදය තුළ ලියැවී ප්‍රකාශයට පත් වී ඇති සිංහල ප්‍රබන්ධ කතාය. එකී කෘතීන් සියල්ලම විග්‍රහයට භාජන කිරීම අසීරු හෙයින් අහඹු නියැදියකට (Random Representative Sample) අනුව තෝරා ගන්නා ලද යෞවන සාහිත්‍ය කෘති සීමිත ප්‍රමාණයක් මෙම නිබන්ධය ලිවීම සඳහා පරිශීලනය කෙරිණ. එම කෘතීන්හි සාහිත්‍යමය අගයට අමතරව අධ්‍යාපනික හා මනෝවිද්‍යාත්මක අගය පිළිබඳව ද මෙම අධ්‍යයනයෙහිලා සාකච්ඡාවට භාජනය වෙයි.

එමෙන්ම මෙහිලා විශ්ව සාහිත්‍යයේ එන පොදු පාඨකයා සඳහා ලියන ලද, එහෙත් යෞවනයන් කතා නායක නායිකාවන් වූ සහ යෞවන ලෝකය වස්තු කොටගත් ප්‍රබන්ධ කතා සීමිත සංඛ්‍යාවක් ද උපයෝගී කොටගෙන ඇත. සාර්ථක යෞවන ප්‍රබන්ධ කතාවක ලක්ෂණ පිළිබඳව පරීක්ෂා කර බැලීමට සහ වස්තු විෂය පුළුල් කිරීමට ප්‍රයෝජනවත් විය හැකි හෙයින්, විශ්ව සාහිත්‍යයේ එන අවුරුදු දොළහේ සිට දහහත දක්වා වියෙහි වූ යෞවනයන්ගේ කියවීම සඳහාම ඉංග්‍රීසියෙන් ලියා පළ කරන ලද උසස් යෞවන ප්‍රබන්ධ කතා ලෙස සම්මාන ලැබූ කෘතීන් සහ වෙනත් භාෂාවලින් ඉංග්‍රීසියට පරිවර්තනය කරන ලද, සාර්ථක යෞවන ප්‍රබන්ධ කතා ලෙස හැඳින්වෙන කෘතීන් සීමිත සංඛ්‍යාවක් ද විසිවැනි සියවසට පෙර සහ විසිවැනි සියවසේ මුල් භාගයේ දී පොදු පාඨකයා සඳහා ලියන ලද, එහෙත් යෞවනයන් හා යෞවන ලෝකය වස්තු කොටගත්, ඉංග්‍රීසියෙන් ලියා පළ කර ඇති කෘතීන් සීමිත සංඛ්‍යාවක් ද ඉංග්‍රීසියෙන් සිංහලයට අනුවර්තනය හා පරිවර්තනය කර ඇති යෞවන පාඨකයා අතර ප්‍රචලිත වූ විශ්ව සාහිත්‍ය කෘතීන් සමහරක් ද මෙම අධ්‍යයනය සඳහා උපයෝගී කොටගෙන ඇත.

යෞවන අවධිය මිනිස් ජීවිතයේ ඉතා වැදගත් අවධියකි. එනම් ළමා වියෙන් වැඩිහිටි අවධියට සංක්‍රමණය වෙමින් සිටින අවස්ථාවයි. එහෙයින් රටක ජීවනාලිය වූ, රටේ අනාගතය භාර ගැනීමේ අපේක්ෂාවෙන් සිටින යෞවනයන් තුළ සමබර

පෞරුෂයක් වර්ධනය කිරීම, දෙමාපියන්, ගුරුවරුන් පමණක් නොව ලේඛකයන් හමුවෙහි ද ඇති භාරදූර කාර්යයකි. එමෙන්ම අභියෝගයකි. තමා ඉදිරියට පමුණුවන, කවර ආකාරයේ සිත් ඇදගන්නාසුලු කතාවක් වුව ද ප්‍රතිග්‍රහණය කිරීමට යෞවනයෝ උත්සුක වෙති. කතාව කුතුහලය දනවන්නේ නම්, සිත් ඇදගන්නේ නම්, එහි සමාජයට අහිතකර හෝ සාරධර්මයන්ට පටහැනි දේ හෝ අන්තර්ගතවී ඇතත් ඒ බව හඳුනාගැනීමට යෞවනයෝ සමත් නොවෙති. එහෙයින් යහපත් උපදේශයක් දීමට මෙන්ම අයහපත් මඟකට යොමු කිරීමට ද කතාවක් උපයෝගී කොටගත හැකිය. එහෙයින් යෞවන සාහිත්‍ය රචකයා විශේෂ වගකීමකින් කටයුතු කළ යුතු පුද්ගලයෙකි. යෞවන අවධියට සුදුසු ප්‍රබන්ධ කතා කවරේදැයි විමර්ශනාත්මකව අධ්‍යයනය කිරීම මෙහිලා වැදගත් වන්නේ එහෙයිනි. එය යෞවන ප්‍රබන්ධ කතා රචකයන්ට ද දෙමාපියන්ට ද විමර්ශකයන්ට ද එමෙන්ම ගුරුවරුන්ට ද ප්‍රයෝජනවත් විය හැකි හෙයිනි.

අනෙකුත් සාහිත්‍ය කෘති සමග සසඳා බලන කල්හි යෞවන සාහිත්‍ය කෘති ඇත්තේ ස්වල්පයක් පමණි. යෞවන ප්‍රබන්ධ කතා ලක්ෂණ විද්‍යමාන වන මාර්ටින් වික්‍රමසිංහගේ ‘අපේ ගම’ කෘතිය ප්‍රකාශයට පත්වූ 1940 සිට 1994 දක්වා වර්ෂ පණස් හතරක කාල පරිච්ඡේදය තුළ යෞවනයන් සඳහාම සිංහලයෙන් ලියා පළ කර ඇති යෞවන ප්‍රබන්ධ කතා දක්නට ලැබෙන්නේ සියයකටත් අඩු සංඛ්‍යාවකි. එමෙන්ම එකී සාහිත්‍ය රචනා සියල්ල උපයෝගී කොටගෙන කරන ලද පර්යේෂණාත්මක සහ ශාස්ත්‍රීය විමර්ශන දක්නට නොමැති තරමිය. එහෙයින් යෞවන සාහිත්‍යය පිළිබඳ විග්‍රහාත්මක තොරතුරු තව දුරටත් පෝෂණය වීම හා යෞවන මනසට ගැළපෙන පොතපත සම්පාදනය කිරීමේ දී ගනු ලබන ප්‍රතිපත්ති සකස් කිරීමට සහාය වීම ද මෙම නිබන්ධයෙන් අපේක්ෂා කෙරේ. විශ්ව යෞවන ප්‍රබන්ධ කතා විමර්ශනයට භාජන කිරීම මෙහිලා විශේෂයෙන්ම වැදගත් වන්නේ යෞවන ප්‍රබන්ධ කතාවන්හි වස්තු විෂය පුළුල් කිරීම සඳහා ද සාර්ථක යෞවන ප්‍රබන්ධ කතාවක ස්වරූපය පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම සඳහා ද එවැනි විමර්ශනයක් ඉවහල් විය හැකි හෙයිනි. සිංහල යෞවන ප්‍රබන්ධ කතාවන්හි වස්තු විෂයෙහි ඒකාකාරී බව මෙම අධ්‍යයනයෙහි දී පෙනී ගිය එක් කරුණකි.

යෞවන සාහිත්‍ය කෘති විචාරයට යොමු වන විචාරකයා තුළ ද සාමාන්‍ය සාහිත්‍ය කෘති විචාරයට ලක් කිරීමේ ශික්ෂණයට අමතරව, අධ්‍යාපන මනෝවිද්‍යාඥයෙකු හා අධ්‍යාපනඥයෙකු තුළ පැවතිය යුතු අවබෝධය ද යම් පමණකට හෝ තිබිය යුතුය. එම

අවබෝධය යෞවන ප්‍රබන්ධ කතා යෞවන මනසට සහ ඒ ඒ සංවර්ධන මට්ටම්වලට ගැළපීමෙහිලා බෙහෙවින් වැදගත් වෙයි.

යෞවන සාහිත්‍ය කෘති පිළිබඳව කරනු ලබන විමර්ශනයක දී යෞවන අවධිය, යෞවන අවධියෙහි විශේෂත්වය, යෞවන සාහිත්‍යය යනු කුමක්දැයි නිර්වචනය කිරීම ද, ඒ සඳහා භාවිත කරනු ලබන ක්‍රමවේදය විග්‍රහ කිරීම ද අවශ්‍යය. එමෙන්ම යෞවන ප්‍රබන්ධ කතාවක සන්දර්භය සලකා බැලීම ද වැදගත්ය. එහෙයින් පළමුවැනි පරිච්ඡේදයෙහි ඉහත කී කරුණු සාකච්ඡාවට භාජන වෙයි. දෙවැනි පරිච්ඡේදයේ මුල් කොටසෙහි යෞවන සාහිත්‍යයෙහි පසුබිම විමර්ශනයට ලක් කෙරෙන අතර, අනතුරුව යෞවනයන් විෂය කර ගත් සිංහල සාහිත්‍යයේ පසුබිම සාකච්ඡාවට භාජනය වෙයි. දෙවැනි හා තුන්වැනි පරිච්ඡේදයන්හි විශ්ව සාහිත්‍යයේ එන යෞවන ප්‍රබන්ධ කතා සංඛ්‍යාවක් කෙටි විමර්ශනයකට ලක් කෙරෙන අතර, සතරවැනි පරිච්ඡේදයේ සිට ඉදිරියට අටවැනි පරච්ඡේදය ද ඇතුළත්ව සාකච්ඡාවට භාජන කෙරෙන්නේ සිංහල යෞවන ප්‍රබන්ධ කතාය. මෙහිලා කතා වස්තුව හා කතා විකාශනය දීර්ඝ වශයෙන් සාකච්ජා කෙරෙන්නේ මෙම පර්යේෂණය පරිශීලනය කරන්නන්ට යෞවන ප්‍රබන්ධ කතාවක ස්වරූපය පිළිබඳව පැහැදිලි අවබෝධයක් ලබා දීමේ අපේක්ෂාවෙනි. නවවැනි පරිච්ඡේදයෙහි යෞවන සාහිත්‍ය භාෂාව පිළිබඳව විමර්ශනය කෙරෙන අතර, නිබන්ධය අවසානයෙහි නිගමන හා යෝජනා ද අනතුරුව ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය ද ඇතුළත් වෙයි.

****************